ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් 25 දෙනෙකු සඳහා චෙන්නායි හි සංචිත බැංකු කාර්ය මණ්ඩල විද්‍යාලයේ පුහුණු වැඩසටහනක්</u>**

ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් 25 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් “මූල්‍ය මායිම් - නවෝත්පාදනය, ඔරොත්තු දීමේ හැකියාව සහ ජාත්‍යන්තරකරණය” යන මැයෙන් පැවති විශේෂ ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වීම සඳහා 2026 මාර්තු 02-06 දක්වා ඉන්දීය සංචාරයක නිරත වූහ.

2. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී ඉන්දියාව විසින් වාර්ෂිකව ශ්‍රී ලාංකික වෘත්තිකයන් 700 දෙනෙකු සඳහා විශේෂයෙන් සැකසූ පුහුණු අවස්ථාවන් පිරිනමන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ.

3. ඉන්දීය රජය විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන සතියක් පුරා චෙන්නායි හි සංචිත බැංකු කාර්ය මණ්ඩල විද්‍යාලයේ දී පැවැත්විණ. මෙම වැඩසටහන මූල්‍ය නවෝත්පාදනය, පද්ධතිමය ඔරොත්තු දීමේ හැකියාව සහ මුදල් ඒකක ජාත්‍යන්තරකරණය වැනි තේමාවන් සම්බන්ධයෙන් වැදගත් කරුණු කාරණා සමඟින් සහභාගිවන්නන් දැනුමින් සන්නද්ධ කිරීමේ අරමුණින් පැවැත්විණ. ක්‍රමෝපායික අවබෝධය සහ ප්‍රතිපත්ති සූදානම ඉහළ නැංවීම සඳහා ප්‍රායෝගික සිද්ධි අධ්‍යයන, ගෝලීය අත්දැකීම් සහ අන්තර් ක්‍රියාකාරී සැසි සමඟින් න්‍යායාත්මක අධ්‍යයනයන් ද වැඩසටහනට ඇතුළත් විය.

4. මෙම වැඩසටහන තුළින් නැගී එන තාක්ෂණයන් සහ මධ්‍යම බැංකුකරණය මත ඒවායේ බලපෑම, සංචිත කළමනාකරණය සහ මුදල් ඒකක ජාත්‍යන්තරකරණය සම්බන්ධයෙන් ක්‍රමෝපායික කරුණු කාරණා, ගෙවීම් පද්ධතීන් සහ මූල්‍ය තාක්ෂණ නියාමන සම්බන්ධයෙන් ගෝලීය වශයෙන් පවතින මනා පිළිවෙත් සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබා දෙන ලදී. එසේම, ක්ෂේත්‍රයේ නිලධාරීන් සහ ප්‍රවීණයන් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීමේ අවස්ථාව ද මෙමගින් හිමි විය.

5. මෙම වැඩසටහන වෘත්තිමය හැකියාවන් ශක්තිමත් කිරීම, දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මූල්‍ය ක්ෂේත්‍රය තුළ ආයතනික සහ රජය - රජය අතර සබඳතා වැඩි දියුණු කිරීම සඳහා අර්ථාන්විත දායකත්වයක් ලබා දෙන ලදී. මෙය තුළින් ධාරිතා ගොඩනැගීම සහ ජනතා කේන්ද්‍රීය ආර්ථික සහයෝගීතාවය සඳහා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ කැපවීම පිළිබිඹු විය.

***

**කොළඹ**
***2026*** මාර්තු ***18***